

## ජගත් ජේ එදිරිසිංහ

# පිණි

## 7



දහවල් දහය පමණ වන තෙක් අමන්දි එක දිගට නිදා ගත්තා ය. අවදි වී බොහෝ වේලාවක් වන තුරුත් බෙහෙත් මත ඇයට පීඩාවක් සේ දැනුණි.
ඈ ඇඳේ වැතිරීගත්වන ම පිටතින් ඇසෙන කතා බහට කන් දී සිටියා ය.

"අමාට මහන්සි නිසා අද අපි ගෙදරම ඉමු.." නදී ගේ කටහඬ අමන්දිට ඇසුණි. ".. අද රෑ කෑමට අපි යාලුවො කීප දෙනෙකුට එන්නත් කිව්වා.. කමක් නෑ නේද..? එයාලත් කැමතියි ඔයාලව අඳුනා ගන්න.."

අමන්ත පිළිතුරක් නොදී සිනාසුණෝ ය. අමුත්තන් හමුවන්නට අමන්දි ගේ සිතේ කැමැත්තක් නැති බව ඔහු දනියි. ඒ බව පවසා නදී ගේ සිත රිදවන්නට ඔහු නොසිතුවේ ය. ".. ඒක හොඳයි.." ඔහු කියයි.

අසනීප වන්නට පෙර කාලයේ අමන්දි කොයි තරම් සමාජශීලී කාන්තාවක වූවා ද? යහලුවන් හඳුනාගන්නටත් ඔවුන් සමග කාලය ගෙවන්නටත් තමාටත් වඩා උනන්දුවක් තිබුණෝ අමන්දිට නොවේද යන්න සිහිපත් වන විට නිමන්ත ගේ සිතේ ඇතිවන්ෙ-න් පුදුමයකි. ඒ පුදුමය ඇගේ මේ පරිවර්තනය සම්බන්ධයෙන් ය.

මුලු දිවා කාලයම අමන්දි ගත කළේ ඇඳේ ඇල වී ගත්වන ම ය. නැගිට සාලයට එන්නට හෝ කතා බහක යෙදෙන්නට හෝ කැමැත්තක් ඇගේ සිතේ නොවී ය. දහවල නිමන්ත ඇඳ ළඟටම ගෙනැවිත් දුන් කෑම පිඟානට පවා ඇය අතක් වත් නොතැබුවා ය. නිමන්ත ගේ යහපත් ක්‍රියාව පවා ඇගේ සිතේ අති කළේ අප්‍රසාදයකි. ඔහු නොකළ යුත්තක් කළා ය යන හැඟීම ඇගේ සිතේ ජනිතව තිබුණි.

නදී සවස සාදයට ඇවැසි දේ ගෙනෙන්නට පිටතට යන හඬ අමන්දි අසා සිටියා ය. නිමන්ත ද ඇය සමගින් යන්නට ඇතැයි ඇය අනුමාණ කළා ය. වාහනය පිටත්ව යන අයුරු ඇය ජනේලය තුළින් දුටුවා ය. ඉන්පසු ඇය නැවත නින්දට වැටුණා ය.

ඇය නැවත පිබිදුණෝ කම්මුල් මත දැවටුණ සියුමැළි අතක සිසිල් පහසින් ය. ඇස් ඇර බැලූ ඇය දුටුවේ සිනාසෙමින් බලා සිටිනා සංසලා යි.

"නැන්දා අද නැගිට්ටින්නෙ නැද්ද..? මට කම්මැළියි.. අම්මල තාමත් නැහැ.." දැරිය කියන්නේ අමන්දි ගේ මුහුණ අසළින්ම කොට්ටය මත සිය සිඟිති මුහුණ තබා ගන්නා අතර ය. අමන්දි පිළිතුරක් නොදී දැරිය ගේ හිස අතගෑවා ය.

"අනේ එන්නකො නැන්දා.."

"මොකටද පුතේ..?"

"මට ඔයාට කියලා චිත්‍රයක් ඇඳගන්න ඕනෙ.." දැරිය අමන්දිගේ අතින් ඇද්දා ය. අමන්දි ඇගේ නිකට අල්ලා සෙළවූවා ය. "දඟයා.. ඉන්න මං මූණ සෝදාගෙන එනකල්" අනතුරුව ඇය කීවා ය.

අමන්දි ඇඳෙන් නැගිට්ටේ සිනාසෙමින් ය. මුහුණ සෝදා අලුත් ඇඳුමකින් සැරසුණ අමන්දි සංසලා සමගින් ඇගේ සිත්තම් පොතේ පිටු කීපයක් පිරෙන්නට චිත්‍ර ඇන්දා ය. සිනාසෙන මලක් ඇන්ද අමන්දි එයට යටින් "සංසලා" යයි ලිව්වා ය.

"කියවන්න පුලුවන්ද මේක..?" ඇය දැරියගෙන් ඇසුවා ය. දැරිය හිස සොළවා පුලුවන් යයි අභිනයෙන් කීවා ය. "සං.. ස.. ලා.. ඒ මගේ නමනේ... අම්මා මට කියලා දීලා තියෙනවා"

"හරිම හොඳයි.." අමන්දි දැරිය සිය තුරුල්ලට ගනිමින් කීවා ය. "තවත් පුරුදු වෙන්න"

සවස සාදය සඳහා ආහාර පිළියෙල කරන්නට ද අමන්දි නදීට හවුල් වූවා ය. ඇය කොයි තරම් සතුටින් ඒ කටයුත්තේ නිරත වූවාද කිවහොත් ඇයට සිය අසනීපය පවා අමතකව ගොස් ඇතැයි නදී සිතුවා ය.

ඉදිරි දොරේ සීනුව නාද වන විටත් ඔවුන් සිටියේ පිසින ලද බුරියානි බත සරසමින් ය. අමුත්තන් පිලිගැනීම සඳහා නදී සාලයට යද්දී අමා කාමරයට වැදුණාය. සැඳෑ සාදය සඳහා ඉස්තරම්ම ඇඳුමකින් සැරසෙන්නට ඇයට අවශ්‍යව තිබුණි. මේ ප්‍රබෝධය තම සිතේ ඇති කළ කුඩා දැරිය පිළිබඳ විසල් සෙනෙහසක් ඇගේ සිතේ විය.

000000000

පැමිණ සිටි අමුත්තන් අතර සිටින උස තරුණයා තමා මෙයට පෙර දැක ඇතැයි නිමන්තට සිතුණි. ලංකාවේදී කොතැනකදී හෝ මේ තරුණයා තමා දැක ඇති බව ඔහුට විශ්වාස ය.

"මේ විශ්වනාත්.. විශ්වනාත් බණ්ඩාර.." අජන්ත අමුත්තා හඳුන්වා දුන්නේ ය. නිමන්ත තරුණයා ගේ අත දෑතින්ම අල්ලා ගත්තේ ය.

"දෙයියනේ විශ්වනාත්.. මේක නම් පුදුම හමුවීම-ක්.. මං ලංකාවෙදි ඔයා හමුවෙන්න කොයි තරම් නම් මහන්සි වුණා ද..?"

තරුණ චිත්‍ර ශිල්පියා නිමන්ත දෙස බලා සිටියේ විශ්මයෙනි.

"මට ඔයාට කියන්න ලොකු කතාවක් තියෙනවා විශ්ව.. සමාවෙන්න මේ වගේ සුන්දර සාදයක් මැද්දෙ ඔයාට මේ කතාව කියන්න හදන එක ගැන.. ඒත් මං මේක ඔයාට දැන් කියන්නම ඕනෙ.. මේක ඒ තරම්මම මට වැදගත්.." නිමන්ත ගේ දෑස් කඳුළින් පිරී තිබෙනු විශ්වනාත්ට පෙනෙයි. තේරුම් ගත නොහැකි කිසියම් අපැහැදිලි හැඟීමකින් ඔහුගේ සිත පිරී යයි.

"ප්‍රශ්නයක් නැහැ.. කියන්න.. මං අහගෙන ඉන්නම්.." විශ්වනාත් තම දකුණත තවමත් දැඩිව අල්ලාගෙන සිටින නිමන්ත ගේ දෑත් මත සිය වමත තබා ගනිමින් කීවේ ය. ".. ඕනෙ නම් අපි පොඩ්ඩක් එළියට යමු.. තවම එළියෙ ඒ හැටි සීතලක් නැහැ.."

නිමන්ත අජන්ත දෙස බැලුවේ ය.

"යං.. මාත් එන්නං.." ඔහු කීවේ ය.

000000

මළානික ඉර එළිය අලුතින් දළුලන ගස් මත වැටී ඇත. ගංගාවේ අනෙක් ඉවුරේ බෝට්ටුවක් පැද යමින් සිටින මිනිසුන් දැන් පැහැදිලිව නොපෙනෙයි. තව විනාඩි කීපයක් යන විට මේ අප්‍රාණික ඉර එළිය ද තුරු මුදුන් අතරින් සැඟවී යනු ඇත.

මං මාවත්වල විදුලි පහන් එකින් එක දැල්වෙන්නට පටන් ගෙන තිබුණි. ඒ සෑම විදුලි පහනක් වටාම සිහින් මීදුම් සේලයක් දැවටෙමි-න් තිබුණේ ආලෝකය මුවා කර ගනිමින් ය.

පැරිසියේ සැන්දෑ අන්ධකාරය හරහා සීතල ගලා එමින් තිබුණ ඒ පැයේ විශ්වනාත් සසළ වූ හදින් නිමන්ත වචනයෙන් වචනය අහුලා ගනිමින් ආයාසයෙන් කියමින් සිටි අමන්දි ගේ කතාව අසා සිටියේ ය. සිය බිරිඳගේ අවාසනා-වන්ත අසනීපය විස්තර කරමින් සිටි නිමන්ත වරින් වර කඳුලු පිස දැම්මේ ය.

"මේ කතාව ඔයාට කරදරයක් වුණා නම් සමා-වෙන්න මිස්ටර් විශ්වනාත්.. ඒත් මට ඔයාගෙ උපකාරය අවශ්‍යයි.." නිමන්ත කීවේ එක එල්ලේ විශ්වනාත් ගේ මුහුණ දෙස බලමින් ය.

"මේ කතාව ඇහුවට පස්සෙ මට මා ගැනම ලොකු කළකිරීමක් ආවා නිමන්ත.. සමාවෙන්න.. මට අමන්දිට උදව් කරන්න තිබුණ පළමුවෙනි අවස්ථාව එදා මම අකාරුණිකව පැහැර ඇරියා.." විශ්වනාත් කීවේ නිමන්තගේ මුහුණ මග හැර ඈත අන්ධකාරය දෙස බලාගත්වන ම ය.